**ශීර්ෂය - 258 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.3 (ආ) සහ (උ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් පහත සඳහන් පරිදි එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද රු.2,979,860 ක වියදම අග්‍රිම ගැලැපුම් ගිණුමට ගලපා නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද වියදම අග්‍රිම ගැලැපුම් ගිණුමට ගැලැපිය යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු විසින් ගෙවා ඇත්තේ නිදහස් දුම්රිය බිල්පත් වටිනාකමයි. එය 1003 වැය විෂයෙන් දරන ලද වියදමක් වන අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ලෙස පෙන්නුම් කරන රු.1,138,996,969 ක් තුළ ඇතුළත් වී ඇත. එය නැවතත් අග්‍රිම ගැලපුම් ගිණුමට බැර කළහොත් අක්මුදල් ගැලපුම් ගිණුම එම වටිනාකමෙන් වෙනස් වන නිසා මෙම වටිනාකම අක් මුදල් ගැලපුම් ගිණුමට බැර නොකළ බව දන්වා ඇත. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව හා ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් වෙනස පිළිවෙලින් රු.114,992 ක් හා රු.82,345 ක්ද අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වෙනස පිළිවෙලින් රු.11,188,872 ක් හා රු.637,518 ක්ද, අග්‍රිම ගැලැපුම් ගිණුමට ගලපා නොතිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව හා දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වෙනස අග්‍රිම ගැලැපුම් ගිණුමට ගැලැපිය යුතු වීම. | භාණ්ඩාගාර පොත් සහ දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පත් ගිණුමේ සහ අත්තිකාරම් ගිණුම්වල වෙනසක් නොමැති නිසා එවැනි ගැලපීමක් අවශ්‍ය නොවන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද ශුද්ධ වියදම ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව රු.6,510,917,896 ක් වුවද අක්මුදල් ගැලපුම් ගිණුමට එම වටිනාකම රු.6,602,134,826 ක් ලෙස එනම් රු.91,216,930 ක් වැඩියෙන් ගැලපුම් කර තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද ශුද්ධ වියදම අග්‍රිම ගැලපුම් ගිණුමට ගැලපිය යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ භාණ්ඩාගාරයට මාසිකව ඉදිරිපත් කරන ලද ගිණුම් සාරාංශ වල වටිනාකම්වල එකතුව ලබාගෙන වන අතර NEW CIGAS වැඩසටහන සම්බන්ධයෙන් මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිරන්තරව නව සංස්කරණයන් (version) ඉදිරිපත් කිරීම හේතුවෙන් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ වටිනාකම් සමුච්චනය වීමේදී වෙනස්කම් සිදුවී ඇති බව දන්වා ඇත. ඒ අනුව ගැලපුම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු. 6,602,134,826 කි. |

**1.6.2.** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------------ |
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව වෙනත් ලැබීම් ලෙස රු.417,607,948 ක් ඒ.සී.ඒ 3 ආකෘතියේ ඇතුළත් කළ යුතු වුවත්, රු.512,218,949 ක් එනම් රු.94,611,001 ක් වැඩියෙන් දක්වා තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස් කරන ලද ශුද්ධ ආදායම මූල්‍ය කාර්යසාධන වාර්තාවේ වෙනත් ලැබීම් යටතේ නිවැරදිව දැක්විය යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ මාසික ගිණුම් සාරාංශ වල සත්‍ය වටිනාකම්වල එකතුව සැලකිල්ලට ගෙන බවත් ආදායමෙන්, ආදායමෙන් ආපසු ගෙවීම් අඩුකර ගැලපීම තාර්කික නොවන බවත් දන්වා ඇත. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ලැබීම් එකතුව හා තැන්පත් ගෙවීම් එකතුව පිළිවෙලින් රු.1,137,279,685 ක් හා රු.759,218,566 ක් වී තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එම වටිනාකම් පිළිවෙලින් රු.1,137,418,505 ක් හා රු.759,375,136 ක් ලෙස පිළිවෙලින් රු. 138,820 ක් හා රු.156,570 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තැන්පත් ලැබීම් හා ගෙවීම්, මාසික ගිණුම් සාරාංශ වලින් උපුටාගත් සංඛ්‍යා මගින් ලබාගත් බව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම ගිණුම තුළ වෙනත් දෙපාර්තමේන්තු වලට අදාළ තැන්පත් ලැබීම් හා ගෙවීම් පවතින අතර ඒවා ඉවත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළ නොහැකි බව. |

### 1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතින් ප්‍රකාරව කාර්යාල උපකරණ ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 ජනවාරි 01 දිනට පිළිවෙලින් රු.21,343,595 ක් හා රු.22,096,600 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර රු.753,005 ක වෙනසක් අනාවරණය වූ අතර, එය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව්කර නොතිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනට කාර්යාලීය උපකරණවල වටිනාකම නිවැරදිව පෙන්වා ඇත. භාණ්ඩාගාරය විසින් හඳුන්වා දුන් New Cigas Web Interface මඟින් අන්තර්ජාල, ජාලගත ක්‍රමය අනුව මෙම වත්කමට අදාළ දත්ත ඇතුලත් කිරීමත් සමඟ නිවැරදිව ගිණුම්ගත වීම හේතුවෙන් 2019 ජනවාරි 01 දිනට මෙකී වත්කමේ වටිනාකම රු.22,096,600 ක් විය. එය නිවැරදිව 2019 ජනවාරි 01 දිනට ශේෂය ලෙස පෙන්වා ඇතත් මෙම රු.753,005 ක වෙනස මූල්‍ය ප්‍රකාශනයෙහි හෙළිදරව් කර නොමැති බව පිළිගන්නා බව. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතිය, භාණ්ඩාගාර වත්කම් වාර්තාව සමඟ සැසඳීමේදී ආරම්භක ශේෂයන්වල වත්කම් අයිතම 07 ක රු.43,059,865 ක වටිනාකමක් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ වැඩියෙන් දක්වා තිබුණු අතර තවත් වත්කම් අයිතම 02 ක රු.43,850 ක වටිනාකමක් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ අඩුවෙන් දක්වා තිබුණි. තවද අවසාන ශේෂයන්වල වත්කම් අයිතම 05 ක රු.64,990,920 ක වටිනාකමක් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ අඩුවෙන් ද වත්කම් අයිතමයක රු.821,584 ක වටිනාකමක් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ වැඩියෙන් ද දක්වා තිබුණි. | වෙනස් වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | මූල්‍ය නොවන වත්කම් පරිගණක ගත කිරීම පහත සඳහන් ආකාරයට ප්‍රධාන අවස්ථා දෙකක් යටතේ වර්තමානයේදී සටහන් කිරීමේ ක්‍රමවේදයක් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී ඇත.<br><br>1. New Cigas පරිගණක වැඩසටහනට දෛනික ගණුදෙනු සටහන් කරන අවස්ථාවේදී මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම.<br><br>2. භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සිය නිල වෙබ් අඩවිය මාර්ගයෙන් හඳුන්වා දී ඇති ජාලගත පහසුකම් තුළින් (Cigas Web Interface) උත්පතනය කිරීම (Upload) මඟින් මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | | ඉහත පැහැදිලි කරන ලද ආකාර දෙකෙන්ම සටහන් කළ විට දෙපාර්තමේන්තුව විසින් ගිණුම් ගත කරන ලද මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ (Bos Report) වටිනාකමට සමාන වේ.<br><br>New Cigas පරිගණක වැඩසටහන මඟින් ගිණුම් ගත කරන මූල්‍ය නොවන වත්කම් භාණ්ඩාගාරය හඳුන්වාදී ඇති Cigas Web Interface වෙත Upload කිරීමේදී වෙනස් පැවතීම නිසා මෙම වෙනස පෙන්නුම් කරන බව. |
| (ඇ) | භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ වර්ෂය තුළ මිලදී ගැනීම් රු.77,649,584 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතියෙහි රු.107,540,209 ක් ලෙස දක්වා තිබීමෙන් රු.29,890,625 ක වෙනසක් පැවතුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය එක් එක් වත්කම් කාණ්ඩයන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දෛනිකව New Cigas පරිගණක වැඩසටහන මඟින් ගිණුම් ගත කරන ලද නිවැරදි වටිනාකම්ය. මෙම වත්කම් කාණ්ඩ භාණ්ඩාගාරය හඳුන්වා දී ඇති Cigas Web Interface වෙත Upload කිරීමේදී වෙනසක් පැවතීම නිසා මෙම ශේෂ අතර වෙනසක් දැක්වෙන බව දන්වා ඇත. |
| (ඈ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතියෙහි වර්ෂය තුළ අපහරණයන් ලෙස අනෙකුත් ආයතනවලින් මාරු කිරීම් යටතේ දක්වා ඇති රු.4,884,090 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී සිදු වී ඇති දෝෂ නිවැරදි කිරීම්වන අතර, වත්කම් අත්පත් කර ගැනීම් යටතේ අනෙකුත් ආයතනවලින් මාරු කිරීම් යටතේ දක්වා ඇති රු.52,743,323 ක වටිනාකම වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් සිදු කළ යුතු අතර විගණනයට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. | ඒසීඒ-6 ආකෘතියේ වර්ෂය තුල වත්කම් අත්පත් කර ගැනීම් යටතේ අනෙකුත් ආයතන වලින් මාරු කිරීම් ලෙස සටහන් කර ඇත්තේ කාර්යාල 21 හි පහත සඳහන් කරුණුය.<br>1. වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට නිකුත් කිරීම් මඟින් ලැබී ඇති වත්කම්වල වටිනාකම් |

| | | | |
|---|---|---|---|
| | | | 2. මෙතෙක් තක්සේරු නොකරන ලද ඉඩම්, ගොඩනැගිලි, කාර්යාල උපකරණ යනාදී වත්කම් හදුනාගෙන තක්සේරු කිරීමෙන් පසු ප්‍රවර්තන වර්ෂයේ දී ගිණුම් ගත කරන ලද වටිනාකම්<br>3. New Cigas මඟින් දෛනික ගණුදෙනු සටහන් කිරීමේදී වත්කම් කාණ්ඩය වාර්තා කිරීමේදී සිදු වී ඇති දෝෂ නිවැරදි කිරීම්<br>ඒසීඒ-6 ආකෘතියේ වර්ෂය තුළ අපහරණයන් යටතේ අනෙකුත් ආයතන වලින් මාරු කිරීම් ලෙස සටහන් කර ඇත්තේ කාර්යාලවල මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී සිදු වී ඇති දෝෂ නිවැරදි කිරීමය. |
| (ඉ) | 2019 වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය තුළ සිදු කරන ලද අපහරණයන් වටිනාකම භාණ්ඩාගාර වත්කම් පිළිබඳ වාර්තාවේ අවසන් ශේෂයන් සමඟ සැසඳීමේදී වත්කම් අයිතම 04 ක රු.24,638,358 ක වටිනාකමක් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ වැඩියෙන්ද වත්කම් අයිතමයක රු.87,355 ක වටිනාකම භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ අඩුවෙන්ද දක්වා තිබුණි. | වෙනස්වීම්වලට හේතු හදුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | ඒසීඒ-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් යටතේ විකිණීම මඟින් අපහරණයන් සහ මාරුකිරීම් මඟින් අපහරණයන් වෙන වෙනම පෙන්වා ඇත. ඒ අනුව වත්කම් කාණ්ඩ අංක 6112205 සහ 6141100 යන ඒවා හැර සෙසු වත්කම් අපහරණ වටිනාකම විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන අනුව නිවැරදිය. New Cigas පරිගණක වැඩසටහන මඟින් කාර්යාල වලින් ගිණුම්ගත කරන ලද අපහරණ වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කර ඇති නමුත් භාණ්ඩාගාර Cigas Web Interface වෙත Upload කිරීමේදී සිදු වී ඇති වෙනස නිසා මෙය සිදුව ඇති බව දන්වා ඇත. |
| (ඊ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අපහරණ වටිනාකම රු.1,956,138 ක් ලෙස දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් | ආයතනයට අදාළ සියළු අපහරණ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ | මූල්‍ය නොවන වත්කම් අපහරණ යටතේ තවදුරටත් සටහන් කලයුතු රු.140,667 ක වටිනාකමට අදාල කාර්යාල දැනුවත් කර 2020 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් සිදු කරන ලද රු.140,667 ක අපහරණ වටිනාකම එහි ඇතුළත් කර නොතිබුණි. | ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු වීම. | |
| (උ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කට අදාළ ග්‍රාම නිලධාරී කාර්යාල 14 ක්, වැඩිහිටි නිවාස 1 ක් සේවා පියස කාර්යාල 3 ක්, පෙර පාසල් වඩු පාසල්, ප්‍රජා ශාලා ඇතුළු රජයේ ඉඩම් සහ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනය සතු සියලු ජංගම නොවන වත්කම්වල පිරිවැය හෝ තක්සේරු අගය මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලද අතර ඔවුන් එහිදී ප්‍රකාශ කර සිටියේ රජයේ සියළුම ආයතනවල වත්කම් තක්සේරු කිරීමට පැවරී තිබීම නිසා ප්‍රමාදයන් සිදුවන බවයි. ඡේදයේ සඳහන් පරිදි මේ දක්වා ගිණුම් ගත වී නොමැති බව පිළිගන්නා අතර නැවතත් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත්කර 2020 වර්ෂය තුළදී ගිණුම්ගත කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. |
| (ඌ) | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් එකතුව රු.83,824,923 ක් හා අත්තිකාරම් ගෙවීම් එකතුව රු.90,291,183 ක් වී තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වටිනාකම් පිළිවෙලින් රු.120,826,535 ක් හා රු.148,179,984 ක් ලෙස පිළිවෙලින් රු.37,001,612 ක් හා රු.57,888,801 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් 258011 ගිණුමට පමණක් අදාළ වන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ මාසික ගිණුම් සාරාංශවල අත්තිකාරම් ගිණුම් යටතේ වන සංඛ්‍යා සියල්ල එකතු කිරීමෙන් නිසා මෙම තත්වය ඇති වී තිබෙන බව දන්වා ඇත. |
| (එ) | 2019 දෙසැම්බර් 31 දිනට ඒසීඒ 3 ආකෘතිය අනුව රු.6,946,869 ක් වූ අග්‍රිම ගිණුම් ශේෂය එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම්වල මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ ද, භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් බැවින් ජංගම වගකීම් යටතේද දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වීම. | 2019 දෙසැම්බර් 31දිනට අග්‍රිම ගිණුමේ ශේෂය වූ රු.6,949,869 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහ ජංගම වගකීම් යටතේ දැක්විය යුතු බව පිළිගන්නා අතර ප්‍රමාද දෝෂයකින් එය පෙන්වා නොමැති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | භාණ්ඩාගාර පොත් අනුව ඒසීඒ 3 අග්‍රිම ගිණුමේ හර හා බැර වටිනාකම් අනුව නොපිය වූ අග්‍රිම ශේෂය රු.6,946,869 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව එය රු.6,943,869 ක් වීමෙන් රු.3,000 ක නොසැසඳීමක් විය. | වෙනසට හේතු හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ මුළු හර වටිනාකම රු.8,260,167,450 ක් වූ අතර බැර වටිනාකම රු. 8,253,220,581 කි. එය දෙපාර්තමේන්තු පොත් අනුව මුළු හර වටිනාකම රු. 8,260,167,450 ක් සහ බැර වටිනාකම රු. 8,253,220,581 ක් වේ. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.1,137,394,677 ක් හා රු.759,300,911 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.1,137,418,505 ක් හා රු.759,375,136 ක් වශයෙන් දක්වා තිබීමෙන් තැන්පත් ලැබීම් රු.23,828 ක් ද තැන්පත් ගෙවීම් රු.74,225 ක්ද වැඩියෙන් දක්වා තිබුණි. | වෙනස්වීමට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලැපීම් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පෙන්විය යුත්තේ මුදල් වර්ෂය තුළ සත්‍ය වශයෙන්ම මුදල් පොතට ලැබූ හා ගෙවූ වටිනාකම් වන අතර, ඒ අනුව වෙනත් දෙපාර්තමේන්තුවලට අදාළ තැන්පත් ලැබීම් හා ගෙවීම්ද සැලකිල්ලට ගැනීම නිසා මෙම තත්වය සිදුවී ඇති බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද ශුද්ධ වියදම ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව රු.6,510,917,896 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කිරීම් යටතේ එය රු.6,602,134,826 ක් ලෙස එනම් රු.91,216,930 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනස්වීමට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලැපීම් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ භාණ්ඩාගාරයට මාසිකව ඉදිරිපත් කරන ලද ගිණුම් සාරාංශ වල වටිනාකම් වල එකතුව ලබාගෙන වන අතර NEW CIGAS වැඩසටහන සම්බන්ධයෙන් මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිරන්තරව නව සංස්කරණයන් (version) ඉදිරිපත් කිරීම හේතුවෙන් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ වටිනාකම් සමුච්චනය වීමේදී වෙනස්කම් සිදුවී ඇති බවත්, ඒ අනුව ගැලපුම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු. 6,602,134,826 ක් බව දන්වා ඇත. |

## 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **හානි පිළිබඳ ලේඛනය**<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හානි පිළිබඳ ලේඛනයක් පවත්වා තිබුණද එය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලිනව පවත්වා ගත යුතු වීම. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන ව පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. |
| (ආ) **වාහන ලොග් පොත**<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසිය 1645(අ) ප්‍රකාරව වාහන 07 ක ලොග් පොත් පවත්වා තිබුණද යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව වාහන ලොග්පොත් යාවත්කාලීනව පවත්වාගත යුතු වීම. | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනවල මූලික තොරතුරු, අළුත් වැඩියා තොරතුරු, සේවා කටයුතු, ඉන්ධන දහන පරීක්ෂා රේට්ස් ඇතුළු සියලු තොරතුරු ඇතුළත් කරමින් ලොග් සටහන් පොත් දෛනිකව යාවත්කාලීන කරමින් පවත්වා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 1.6.6 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ප්‍රජාමූලික හරිත සමාජ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අගෝස්තු මස පරිපූරක ඇස්තමේන්තුව මගින් රු.4,050,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. උඩුනුවර හා පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රතිපාදන නැවත | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගාර ලේකම්ගේ 2019 නොවැම්බර් 20 දිනැති අංක BD/GPS155/09/01/HA-2019 හා ලිපිය සහ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 නොවැම්බර් 22 දිනැති අංක HAF-1/5/info'G ලිපිය අනුව වැඩසටහන ක්‍රියාත්මක කිරීම අත්හිටුවා උඩුනුවර හා පන්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ප්‍රතිපාදන දිස්ත්‍රික් |

| | |
|---|---|
| පවරාදී තිබුණි. මේ සම්බන්ධව විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව නොපැවතුණි. | ලේකම්වරයා වෙත පිළිවෙලින් 2019 දෙසැම්බර් 10 හා 18 දිනවල නැවත පවරාගෙන ඇති බව දන්වා ඇත. |

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 5 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පෙන්වා දී ඇති කාරණය කෙරෙහි අවධානය යොමු කර, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් කඩිනමින් සිදු කර ලොග් සටහන් පොත්වල ද සටහන් කර ඒ සම්බන්ධයෙන් විගණනය වෙත දැන්වීමට පියවර ගන්නා බව දන්වා ඇත. |

### 1.6.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 01-239701 යටතේ මියගිය විශ්‍රාම වැටුප් ලාභිනියකගේ 2008 මැයි මස සිට 2012 ජනවාරි මස දක්වා කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.428,911 ක විශ්‍රාම වැටුප ඇයගේ දියණිය විසින් වංචනික ලෙස ලබා ගෙන තිබුණි. ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104(4) වාර්තාව අනුව ඊට | වංචාවලට අදාළ පරීක්ෂණ කඩිනමින් පවත්වා වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධව අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණය ප්‍රකාරව ග්‍රාම නිලධාරීන් දෙදෙනෙකුගෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර, තවත් ග්‍රාම නිලධාරියෙකු, විශ්‍රාම වැටුප් නිලධාරියෙකු හා ලේඛන සහකාර නිලධාරියෙකු 2016 මැයි 02 දිනැතිව, අභියාචනා ඉදිරිපත් කර ඇති බැවින් ඊට අදාළ අමාත්‍යාංශ තීරණ ලැබෙන තෙක් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු බව දන්වා තිබුණි. යථෝක්ත නිර්දේශයට අනුව මේ වන විට විශ්‍රාම ගොස් සිටි ග්‍රාම නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.214,609 ක මුදලක් අයකරගෙන තිබුණද, ඉතිරි නිලධාරීන්ගෙන් ඔවුන්ගේ අභියාචනා හේතුකරගෙන 2019 දෙසැම්බර් 31 දින වන විටද අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | යථෝක්ත විශ්‍රාම වැටුප් වංචාවට අදාළව 2013 අගෝස්තු 30 දිනැති අංක HAF-3-DICIP-02/004 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් ඉහත නිර්දේශයේ සඳහන් එක් ග්‍රාම නිලධාරී මහතෙකුට එරෙහිව කටයුතු නොකිරීමට තීරණය කර ඇති බව දන්වා තිබුණි. එහෙත් 2016 පෙබරවාරි 11 දින සිදු කළ මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණයෙන් මොහු අලාභයට වගකිවයුතු බවට තීරණය කර ඔහුගේ විශ්‍රාම වැටුපෙන් රු.113,300 ක මුදලක් අය කර ගෙන තිබුණි. | මූලික විමර්ෂණවල නිර්දේශයන් සලකා මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ සිදු කිරීම. | මූලික විමර්ශන වාර්තාව අනුව එක් ග්‍රාම නිලධාරි මහතෙකුගෙන් රු.42,641 ක මුදලක් අය කර ගැනීමට තීරණය කර ඇති අතර, මු.රෙ.104(4) පරීක්ෂණය අනුව උක්ත කරුණ සඳහා ජීවිත සහතිකයක් නිකුත් කිරීමේදී එය නිසි පරිදි අනුගමනය කළ යුතු ක්‍රමවේදයට බැහැරව කටයුතු කර නොතිබීම හේතුවෙන් ඔහුගේ සේවා කාලය හා ඉදිරි වර්ෂ සඳහා වන බලපෑම සැලකිල්ලට ගෙන රු.113,300 ක මුදලක් අයකර ගැනීමට තීරණය කර ඇති බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 258-1-1-0-2509 වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 75 ක ඉතිරිවීම් පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. | 258-1-1-0-2509 සඳහා පරිපූරක ප්‍රතිපාදන වෙන් කර දෙන ලද්දේ 2019 අගෝස්තු 09 දින වන අතර, ඒ වන විට වර්ෂයේ මාස 08 ක කාලයක් ගෙවී තිබූ නිසා ප්‍රජාමූලික හරිත සමාජ පිහිටුවීම පිළිබඳ කාර්යයන් සිදු කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. |
| (ආ) වැය විෂයයන් 2 ක එකතුව රු.3,738,827 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා පිළිගත හැකි හේතුන් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. | 258-1-2-0-1506 වැය විෂයයෙන් දරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ දේපළ ණය සඳහා රජයේ පොලී දායකත්වයයි. දේපළ ණය ලබාගැනීමට සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් විශාල ප්‍රමාණයක් සිටි හෙයින් මෙම මුදල ඇස්තමේන්තු කළ ද විවිධ අඩුපාඩු මත ණය ඉල්ලුම්පත් බැංකුව වෙත ඉදිරිපත් නොවීම නිසා මෙම ඉතිරිය ඇතිව තිබූ අතර, 258-1-1-0-2509 වැය විෂයයේ අපේක්ෂිත ඉතිරිය රු.2,874,500 කි. මෙම ප්‍රතිපාදන 2019 අගෝස්තු මස ලද පරිපූරක ප්‍රතිපාදනයක් වන අතර, ප්‍රමාණවත් කාලයක් නොවීම හේතුවෙන් ඉතිරිවීම් සිදුව ඇති බව දන්වා ඇත. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයය 258-1-2-0-1403 සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් රැස් කරගන්නා ලද බැරකම් වටිනාකම රු.400,174 ක් වුවද, බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ සටහන (iii) හි එය රු.386,465 ක් ලෙස රු.13,709 ක් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ විධි විධානවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | මෙය ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සිදු වී ඇති බව දන්වා ඇත. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 21 ක් විසින් ලබාදුන් එකතුව රු.7,983,946,587 ක් වූ ප්‍රතිපාදනවලින් වර්ෂය තුළ රු.855,817,282 ක් එනම් සියයට 11 ක් ආපසු පවරා දී තිබුණි. ඉන් රු.801,198,778 ක මුදලක් මූලධන ප්‍රතිපාදන ආපසු පවරාදීම් විය. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. | 2019 වර්ෂය තුලදී මහනුවර දිස්ත්‍රික්කයේ ජන ජීවිතය නංවාලීම සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 92 ක ප්‍රමාණයක් උපයෝජනය කර තිබූ අතර සියයට 8 ක ඉතිරියක් වාර්තා කර තිබුණි. එය ඉහළ කාර්ය සාධන මට්ටමක් බව දන්වා ඇත. |
| (ආ) | අමාත්‍යාංශ දෙකකින් ලැබී තිබූ එකතුව රු.56,556,000 ක් වූ මූලධන ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ආපසු පවරාදී තිබුණි. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රු.6,556,000 ක ප්‍රතිපාදන ලැබී ඇත්තේ මහනුවර මහමායා විද්‍යාලයේ ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා වන අතර ප්‍රතිපාදන වෙන් කිරීම 2019 නොවැම්බර් මස සිදුව තිබීම හා ව්‍යාපෘති සංශෝධනයන් අනුමත වීම 2019 දෙසැම්බර් මස සිදු වීම හේතුවෙන් ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කටයුතු දින 20 ක් තුළ අවසන් කිරීමට නොහැකි බැවින් ප්‍රතිපාදන ආපසු පවරා දුන් බව දන්වා ඇත.<br>කන්ද උඩරට උරුමය හා |

| | | | |
|---|---|---|---|
| | | | මහනුවර සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.50,000,000 ක ප්‍රතිපාදන ලැබී ඇත්තේ දංගොල්ල ක්‍රීඩාංගණය සහ ක්‍රීඩාගාරය සංවර්ධනය කිරීම සඳහා වන අතර, ප්‍රසම්පාදන කටයුතු සිදුකර ව්‍යාපෘතිය නිම කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රතිපාදන පවරා දී ඇති බව දන්වා ඇත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළුව අමාත්‍යාංශ 08 ක් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති වෙනුවෙන් නිරවුල් කළ යුතු බිල්පත්වල එකතු වටිනාකම රු.568,037,770 ක් වූ අතර, මෙම බිල්පත්වලින් රු.458,702,045 ක බිල්පත් 2020 මැයි 18 දින වන විට ද නිරවුල් කර නොතිබුණි. | කාර්ය නිමවී ඇති ව්‍යාපෘතිවල කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික්කය තුල සිදු කරන ලද විවිධ සංවර්ධන වැඩසටහන් සඳහා 2019 වර්ෂය අවසන් වන විට රු. මිලියන 568 ක පමණ බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. ඊට හේතු වූයේ ඒ සඳහා ප්‍රමාණවත් අග්‍රිම මහා භාණ්ඩාගාරයෙන් නොලැබීමයි. 2020 වර්ෂයේ මාස 05ක් ඉකුත් වී ඇතත් එම අතැති බිල්පත් සියල්ලම නිරවුල් කර අවසන් කිරීමට ප්‍රමාණවත් අග්‍රිම මේ දක්වා ලැබී නොමැති බව දන්වා ඇත. |

(ඇ) **ජනාධිපති ලේකම් කාර්යාලය**

| | | |
|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ප්‍රජාව සවිබල ගන්වමින්, දිළිඳුකම ජය ගැනීමේ හැකියාව ඔවුන්ගේම අතට පත්කොට දහස් ගණනින් අනෙක් ප්‍රජාවන් සමඟ අත්වැල් බැඳ ගනිමින් ස්වකීය ශක්තියෙන් නැගී සිටීමට හැකියාව ලබා දීමේ අරමුණින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කර තිබුණි. එහි පළමු අදියරේ ලියාපදිංචි සමිති 62 ක් සඳහා 2018 හා 2019 වර්ෂවලදී වර්ෂයකට රු.මිලියනය බැගින් ද දෙවෙනි අදියරේ සමිති 181 ක් සඳහා මූලික තැන්පතුව ද ඇතුළත්ව රු.410,000 බැගින් ද එකතුව රු.193,800,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එසේ | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යවස්ථා මාලාවේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු වීම. | ග්‍රාම ශක්ති පළමු අදියරට අදාළ දෙවන වාරිකය 2019 මැයි 24 ලිපියෙන් වෙන් කර තිබූ අතර, 2019 ජූනි 04 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලෙස දන්වා ඇත. එහෙත් අග්‍රිම ලබා දී නොමැති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 04 ක සමිති 08 ක මිලියන 08 ක මුදලක් බැංකු ගිණුම්වලට බැර කිරීමට නොහැකි වූ බවත්,<br><br>දෙවන අදියර පළමු වාරික මුදල් ප්‍රතිපාදන 2019 පෙබරවාරි 27 දින ලබා දී ඇති නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක සමිති 101 ක ලියාපදිංචි |

වුවද,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4 ක පළමු අදියරේ සමිති 9 ක් සඳහා 2019 වර්ෂය වෙනුවෙන් රු.8,000,000 ක් ද දෙවන අදියර යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 12 ක සමිති 102 ක් සඳහා රු.40,400,000 ක් ද 2020 අප්රේල් 30 දින වන විට සමිති ගිණුම්වලට බැර කර නොතිබුණි.

(ii) එම මුදලින් පළමු අදියරේ සමිති සඳහා ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය ජීවනෝපාය, ධාරිතා හා යටිතල පහසුකම් සඳහා පිළිවලින් සියයට 42.7 ක්, සියයට 23.6 ක් හා සියයට 56.6 ක් වීමෙන් සමස්ථ උපයෝජනය සියයට 41.5 ක් වූ අතර දෙවන අදියරේ සමිති සඳහා ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය ජීවනෝපාය හා ධාරිතා සඳහා පිළිවලින් සියයට 6 ක් හා සියයට 9 ක් වීමෙන් සමස්ථ උපයෝජනය සියයට 7 ක් පමණක් විය.

කටයුතු අවසන් නොවීම නිසා රු.40,400,000 ක මුදලක් සමිති වෙත නිදහස් කිරීමට අග්‍රිම නොමැති වීම හේතුවෙන් ගැටලු ඇති වූ බවත් දන්වා ඇත.

**(ඉ) සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

(i) ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ නංවමු ලංකා වැඩසටහන වෙනුවෙන් රු.24,525,013 ක් වැයකර ආහාර නිෂ්පාදන අළෙවි උපකරණ, ඇඟලුම් නිෂ්පාදන උපකරණ, විදුලි උපකරණ, කෘෂි කාර්මික කටයුතු සහ වඩුවැඩ සඳහා අවශ්‍ය උපකරණ, කාර්මික

ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයෙන් ප්‍රමාදයකින් තොරව ක්‍රියාවට නැංවිය යුතු වීම.

මිළදීගත් උපකරණ කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වෙත භාරදෙන ලෙස අමාත්‍යාංශ ලේකම්ගේ 2020 පෙබරවාරි 15 දිනැති ලිපියෙන් දන්වා ඇතත් ගබඩා පහසුකම් හා ප්‍රවාහන පහසුකම් සැලැසුම් කර 2020 මාර්තු 14, 16 හා 17 දිනවල පල්ලේකැලේ සිවිල් ආරක්ෂක

| | | | |
|---|---|---|---|
| | උපකරණ හා කාන්තාවන් සඳහා මහන මැෂින් යනාදිය 2019 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල මිලදී ගැනීම් සිදුකර තිබුණි. 2020 පෙබරවාරි වන විටත් බෙදාදීමකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාන කිහිපයක ගබඩා කර තිබූ මෙම උපකරණ විගණන විමසුම නිකුත් කිරීමෙන් පසු 2020 මාර්තු මාසයේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වෙත භාර දී තිබුණි. | | දෙපාර්තමේන්තු ගබඩාවට ප්‍රවාහනය කර භාරදීමට කටයුතු කළ බව දන්වා ඇත. |
| (ii) | මිලදීගෙන තිබූ උපකරණ ගබඩාවල රඳවා තබා ගැනිමෙන් එම භාණ්ඩවල වගකීම් කාලය ඉක්මවීමේ අවධානමක් මෙන්ම මිලදී ගැනීමෙන් පසු සේවා සැපයීමේ වාසිදායක තත්ත්වයද අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | භාණ්ඩ මිලදී ගැනීමෙන් අත්වන වාසි ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දී ඇති තත්ත්වය අමාත්‍යාංශය වෙත වාචිකව දැන්වුවද උපකරණ විධිමත්ව භාරදීම සම්බන්ධයෙන් උපදෙස් ලැබී නොතිබීම මීට හේතු වූ බව පෙන්වා දෙන අතර, වගකීම අමාත්‍යාංශය වෙත පවතින බව දන්වා ඇත. |
| (iii) | 2019 ඔක්තෝම්බර් 22 දිනැති අංක EC/EDR/PRE/INQ /2019 දරන "නංවමු ලංකා" වැඩසටහන සම්බන්ධයෙන් නිකුත් කළ මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ෂණ)ගේ ලිපියට අනුකූල නොවී රු.18,140,573 ක් වටිනා යන්ත්‍රෝපකරණ 2019 නොවැම්බර් 18 දිනට පෙර මිලදී ගෙන තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මැතිවරණ කොමිෂන් සභාව අමාත්‍යාංශ ලේකම් අමතා ඇති 2019 ඔක්තෝබර් 22 දිනැති ලිපිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සන්නිවේදනය වී නොතිබීම හේතුවෙන් රු.18,140,573 ක මිලදී ගැනීම් 2019 නොවැම්බර් 18 දිනට පෙර සිදු කර ඇති බව දන්වා ඇත. |

### (ඊ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| තුම්පනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වැන්දඹු අංක 21-25006 හිමි විශ්‍රාම වැටුප් ලාභියෙකුගේ 1993 නොවැම්බර් 23 දින සිට පවත්වාගෙන යන තාවකාලික ගොනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ස්ථිර ගොනුවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නිලධාරීන් තම රාජකාරිය නිසි ලෙස ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | හැඳුනුම්පත සකස් කිරීමට අදාළ ග්‍රාම නිලධාරී වාර්තා කැඳවා තිබුණද ඇය අසනීප තත්වයෙන් පසුවූ බැවින් ප්‍රමාද වී ඇත. මේ වන විට හැඳුනුම්පත සකස් කර ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව දන්වා ඇත. |

### (උ) කාන්තා කාර්යාංශය

| | | |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් ක්‍රියාත්මක චක්‍රීය ණය වැඩසටහන යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන්ගෙන් උඩපළාත, හාරිස්පතුත්ව හා පාතහේවාහැට යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල 2020 ජුනි 30 දින වන විට ණය ශේෂ 06 කට අදාළව රු.24,015 ක් වර්ෂ 1 ත් වර්ෂ 10 ත් අතර කාලපරිච්ඡේදයක් තුළ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් තම රාජකාරිය නිසි ලෙස ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | පන්විල, දොළුව හා පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල හිඟ ණය පියවා ඇති අතර, උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ එක් ශේෂයක් ද හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශේෂ 02 ක් ද පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශේෂ 03 ක් ද තවදුරටත් අයකර ගැනීමට ඇති බව දන්වා ඇත. |
| (ii) ග්‍රාමීය කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නංවාලීම තුළින් ඔවුන්ගේ ඉතිරි කිරීමේ ප්‍රවණතාවය වැඩි දියුණු කර දෛනික ගනුදෙනු විධිමත් පරිදි හැසිරවීමට පෙළඹවීම හා අධික පොලී මත ණය ලබා ගැනීමට යොමු වීම වළක්වාලීමේ අපේක්ෂිත අරමුණ ඇතිව කාන්තා කාර්යාංශය මඟින් චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක වුවත්, 2019 වර්ෂය සඳහා මැදදුම්බර, හතරලියද්ද හා දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ග්‍රාමීය මට්ටමේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාවට නැංවිය යුතුවීම. | චක්‍රීය ණය වැඩසටහන සඳහා මුදල් ඉල්ලා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය වෙත ඉල්ලීමක් සිදු කළ ද මේ වන තෙක් ප්‍රතිපාදන ඒ සඳහා ලැබී නොමැති බව ප්‍රාදේශිය ලේකම්වරු දන්වා ඇත. |

| | | |
|---|---|---|
| (iii) 2017 ජනවාරි 12 දිනැති අංක MWGA/WB/ග්‍රා.කා.සැ/2017 දරන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂකගේ ලිපිය ප්‍රකාරව ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි කාන්තා කාර්ය සමාජ පිහිටුවා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු වුවද, නියැදි පරීක්ෂාවේදී පාතහේවාහැට, උඩදුම්බර, උඩුනුවර, හාරිස්පත්තුව, අකුරණ, මිනිපේ හා හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම නිලධාරී වසම් 684 කින් කාන්තා කාර්ය සමාජ 44 ක් ලියාපදිංචි කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සමිතිවල ගිණුම් ආරම්භ කිරීමේ කටයුතු සමිති මට්ටමින් ප්‍රමාදයක් පවතින බවත්, ලියාපදිංචි ලියවිලිවල අඩුපාඩු හේතුවෙන් ලියාපදිංචිය ප්‍රමාද වී ඇති බවත් ලියාපදිංචි ගාස්තු රු.1,050 ක් වීමත් හේතුවෙන් ලියාපදිංචිය ප්‍රමාද වී ඇති බව ප්‍රාදේශීය ලේකම්වරු දන්වා ඇත. |

**(ඖ) පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි ළමා සමාජ පිහිටුවා පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි ග්‍රාම නිලධාරී වසම් 1187 කින් වසම් 1002 ක පමණක් ළමා සමාජ ලියාපදිංචි කර තිබුණි. | දිස්ත්‍රික් රැස්වීම් උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ලියාපදිංචි නොකළ ළමා සමාජ ලියාපදිංචියට අවශ්‍ය අයදුම්පත් ගෙන්වා කඩිනමින් ළමා සමාජ පිහිටුවීමට පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් දන්වා ඇත. |

**(එ) වැඩිහිටි මහ ලේකම් කාර්යාලය**

| | | |
|---|---|---|
| (i) 2018 ඔක්තෝබර් 15 දිනැති අංක NSE/EL/01/2018 දරන සමාජ සුභසාධක හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.1.5 ඡේදය ප්‍රකාරව වැඩිහිටි දීමනා මාස 03 ක් අඛණ්ඩව ලබා නොගත් බව ලේඛනය අනුව තහවුරු වීමෙන් පසු විෂය ලිපිකරු විසින් වැඩිහිටි දීමනාලාභියා ලේඛනයෙන් ඉවත් කිරීමට ප්‍රථම ප්‍රාදේශීය කමිටුවෙන් අනුමැතිය ලබා ගත යුතු විය. එහෙත් ප්‍රාදේශීය කමිටු අනුමැතියෙන් තොරව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මාස 03 ක් ලබා නොගන්නා ලද වැඩිහිටි දීමනා අත්හිටුවා තිබුණද 2020 වර්ෂයේදී සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් චක්‍රලේඛ උපදෙස් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු සිදු කරන බවත් පෙර වර්ෂයේ දීමනා අත්හිටුවීම සම්බන්ධයෙන් ද පරීක්ෂා කර වාර්තා කරන ලෙසත් උපදෙස් ලබා දුන් බව, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. වැඩිහිටි දීමනා මාස 03 ක් අඛණ්ඩව ලබා නොගත් ප්‍රතිලාභීන් ලේඛනයෙන් ඉවත් |

| | | | |
|---|---|---|---|
| | හතරලියද්ද හා දොළුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 හි දීමනාලාභීන් පිළිවෙලින් 03 දෙනෙකුගේ හා 07 දෙනෙකුගේ නම් ඉවත් කර තිබුණි. | | කිරීම සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය කමිටු තීරණ මඟින් සිදු කරනු ලබව බව දොළුව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |
| (ii) | උක්ත චක්‍රලේඛයේ 2.3 ඡේදයේ විධි විධානයන්ගෙන් බැහැරව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ප්‍රාදේශීය කමිටුවක් නොමැතිව, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරීන් විසින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදුකර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රාදේශීය කමිටු සාකච්ඡාවන් මඟින් සිදුකළද කමිටු වාර්තා සකස් කිරීම මෙතෙක් සිදුකළ නොමැති නමුත් ඉදිරියේදී කමිටු වාර්තාව සකස් කිරීමට කටයුතු කරන බව තුම්පනේ ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |
| **(ඒ)** | **කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය** | | |
| | ගර්භනී සමයේ නිසි කලට නිසි පෝෂණය ලබාදීම සහ අඩුබර දරු උපත් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ අරමුණු පෙරදැරි කර ගනිමින් පෝෂණ මල්ල වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවද මැදදුම්බර, තුම්පනේ, පාතහේවාහැට හා දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2019 දෙසැම්බර් 31 දින වන විට අවස්ථා 893 කදී රු.1,786,000 ක මුදලක් පෝෂණ මල්ල ලබා නොගෙන ආපසු යවා තිබුණි. | ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතු වීම. | මව්වරුන් දරුවා ලැබීම සඳහා වෙනත් කොට්ඨාශයකට යාම, නොසැලකිලිමත් කම, මව්වරුන් පෝෂණ වවුචරය අස්ථානගතකර ගැනීම, ගබ්සාවීම, කාලය ඉකුත් වූ පසු පැමිනීම යන හේතු මත පෝෂණාධාර ලබා නොගැනීම සිදුවන බව ප්‍රාදේශීය ලේකම්වරුන් පොදුවේ දන්වා ඇති අතර සෑම මවකටම වෙළඳ ආයතන නම් කර ලිපි යැවීම සායන මට්ටමින් දැනුවත් කිරීම සිදු කර ඇත. පෝෂණ මල්ල වැඩසටහන යටතේ භාණ්ඩ නිකුත් කිරීම මාසයේ 20 සිට 30 දින දක්වා සිදු කිරීම, වෙළඳසැල් ඉදිරියේ දැන්වීම ප්‍රදර්ශනය කිරීම ග්‍රාම නිලධාරි මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීම ආදී ක්‍රම කිහිපයක් ඔස්සේ මව්වරුන් දැනුවත් කිරීම සිදු කරනු ලබන බව දන්වා ඇත. |

(ඔ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | | | |
|---|---|---|---|
| (i) | 2018 / 2019 මහ කන්නය සඳහා වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේ සීමා සහිත මහනුවර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය වෙත අවස්ථා 04 කදී රු. මිලියන 10 ක් ලබාදී තිබුණි. එම මුදලින් අවස්ථා දෙකකදී ලබා දුන් රු.මිලියන 05 ක මුදලක් මාසයක ප්‍රමාද කාලයක් සහිතව පියවා තිබූ අතර 2019 අගෝස්තු 05 හා ඔක්තෝබර් 31 යන දිනවල ලබා දී තිබූ පිළිවෙලින් රු.මිලියන 4 ක් හා රු.මිලියන 1 ක මුදල 2020 ජුනි 30 දින වන විට ප්‍රමාද කාලය පිළිවෙලින් මාස 04 ක් හා මාස 02 ක් ගතව තිබුණ ද පියවා නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් පියවීමට කටයුතු කළ යුතු වීම. | ගිවිසුමේ කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද ආකෘතියක් බැවින් එහි වගන්ති වෙනස් කිරීමට කටයුතු නොකරන ලදී. මෙම මුදල 2019 දෙසැම්බර් 31 දින වන විට ගෙවා අවසන් කරන මෙන් 2019 දෙසැම්බර් 18 දිනැති ලිපියෙන් සිහිපත් කිරීමක් කර ඇත. එහෙත් ඔවුන් ගිවිසුම ප්‍රකාරව අදාළ මුදල නොගෙවීම නිසා සාකච්ඡාවක් 2020 ජනවාරි 20 දිනද පවත්වා ඔවුන් සමඟ මෙම මුදල් නොගෙවීම නිසා ඇතිවිය හැකි ගැටළු පෙන්වා දී කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 2020 අප්‍රේල් 22 දින මහනුවර විශේෂ අපරාධ විමර්ශන අංශයට පැමිණිලි කර ඇති බව දන්වා ඇත. |
| (ii) | 2019 මැයි 15 දින මහනුවර දිස්ත්‍රික් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් ඉහත සමූපකාර සමිතියේ ණය මුදල් පියවීමේ නොහැකියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරයා වෙත දන්වා තිබියදී හා ඉහත පරිදි ණය මුදල් ගෙවීම ප්‍රමාද කර තිබියදී නැවත රු.මිලියන 01 ක ණය මුදලක් සමූපකාර සමිතිය වෙත ගෙවා තිබීම ගැටළුකාරීවන අතර, ගිවිසුමට ප්‍රමාද ගාස්තු අය කර ගැනීම පිළිබඳ වගන්තියක්ද ඇතුළත් කර නොතිබුණි. | ණය ගෙවීමේ හැකියාව හා පසුගිය ණය පියවීම් පිළිබඳ තොරතුරු පිළිබඳව තහවුරු ලබාගැනිමෙන් අනතුරුව ණය ලබාදීම් සිදු කළ යුතු වීම. | 2019 මැයි 15 වන දින ඉදිරිපත් කරන ලද අදාළ වාර්තාවේ එසේ සඳහන් වුවත් 2019 අගෝස්තු 05 වන දින ලබාදෙන ලද රු.මිලියන 4 මුදල සඳහා 2019 ජූලි 24 දිනැති ලිපියෙන්ද 2019 ඔක්තෝබර් 31 දින ලබාදෙන ලද රුපියල් මිලියන 1 මුදල සඳහා 2019 සැප්තැම්බර් 06 ලිපියෙන්ද සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශ ලබාගෙන ඇති බව දන්වා ඇත. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශයට අනුව 2019 දෙසැම්බර් 31 දින වන විට අයවීමට ඇති හිඟ ණය ශේෂය රු.680,024 ක් විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.178,250 ක ණය ශේෂයක් ද සේවය අතහැර ගිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.170,276 ක ණය ශේෂයක් ද 2020 ජුනි 30 දින වන විට වර්ෂ 6 ත් වර්ෂ16 ත් අතර කාලයක් ගත වී තිබුණද අයවීම් හිඟ හිටිව පැවැතුණි. | ලබාදුන් ණය අත්තිකාරම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02ක වැඩ තහනම් කල නිලධාරීන් තිදෙනෙකුගෙන් 2019.12.31 දිනට අයවීමට පවතින ශේෂය රු.208,230 ක් බව පිළිගනිමි. එම ණය ශේෂ වල වර්තමාන තත්වය අනුව රු.24,440 ක ණය ශේෂය මුළුමණින්ම 2020 ජුනි 03 දින අයකර ගෙන ඇති අතර, රු.47,170 ක ණය ශේෂයෙන් රු.5,540.00ක් අයකර ඇත. රු.136,620 ක ණය ශේෂය හිමි නිලධාරියාට එරෙහිව සිදු කෙරෙන විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. අනෙක් නිලධාරීන් දෙදෙනාගේ විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා බව දන්වා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3.5 වගන්තිය ප්‍රකාරව ණය ලබාදීමේදී නිලධාරියාගේ වැටුපෙන් මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව, සියයට 40 සීමාව නොඉක්ම විය යුතුය. එම සීමාව ඉක්මවා අවස්ථා 06 කදී රු.283,782 ක ණය ලබා දී තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සියයට 40 සීමාව නොඉක්මවන පරිදි ණය ලබා දිය යුතු වීම. | වැටුපෙන් සියයට 40 ගණනය කිරීමේ දී ප්‍රමාද දෝෂ සිදු වී ඇති බව පිලිගන්නා අතර එවැනි දෝෂ සිදු නොවන ආකාරයට ඉදිරියේ දී කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වා ඇත. |

**2.5** **තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2018 යටතේ මිනිගමුව මහ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නිමකර 2018 නොවැම්බර් 14 දින තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරදී තිබුණ ද එහි අඩුපාඩු සම්පූර්ණ කර නොගැනීම හේතුවෙන් රු.67,901 ක රඳවුම් මුදල් වර්ෂයකට වැඩිකාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | සංවර්ධන ව්‍යාපෘතිවල ඉටු කරගත යුතු අඩුපාඩු හැකිතාක් ඉක්මනින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමෙන් පසු ව්‍යාපෘතියේ අඩුපාඩු කොටසක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර, කොවිඩ් 19 ආපදා තත්ත්වය හේතුවෙන් වැඩ කටයුතු නිම කිරීමට නොහැකි විය. මේ සම්බන්ධව අදාළ විදුහල වෙත සිහිකැඳවීම් යවා ඇති බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |

**3.** **මෙහෙයුම සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලැසුම් කිරීමට හා අනාවරණය වූ වෙනත් සැලැසුම් කිරීමේ ඌනතාවයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛයේ 3 (අ) ඡේදය අනුව සංවිධාන ව්‍යුහය ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ කෙටුම්පත සඳහා ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණද දැනට සකස් කර ඇති වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට එම තොරතුරු ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහාවන අක්මුදල් අවශ්‍යතාවයට අනුව වාර්ෂික අක්මුදල් සැලැස්ම මහා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත වෙනම ඉදිරිපත් කර ඇතත් |

| | | | |
|---|---|---|---|
| | | | කෙටුම්පත් වාර්ෂික ක්‍රියාත්මක සැලැසුමට ඇතුළත් නොවූ අතර, දැනට පිළියෙල කර ඇති ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | සැලැසුම් කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම වෙන් වෙන්ව සකස් කර තිබුණද චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම පෙන්වා දී ඇති පරිදි දැනට පිළියෙල කර ඇති ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ දොළුව ඉල්ලගොල්ල කණිෂ්ඨ විදුහලේ ගුරුභවතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සලසාදීමට විදුහලේ පාසල් සංවර්ධන සමිතිය විසින් රු.194,000 ක වැඩ වටිනාකමකට වැසිකිළියක් නිමකර තිබුණද ඉදිකර ඇති වැසිකිළියේ කොන්ක්‍රීට් ස්ලැබ් එකෙහි යටි පැත්ත දළඹගසා නොතිබූ අතර, වැසිකිළිය සඳහා වටපිලක් යෙදීම ද සිදු කර නොතිබුණි. | ඇස්තමේන්තු හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුවීම. | වැසිකිළියේ දළඹ ගැසීම හා වටපිල යෙදීම අනුමත වී ඇති මුදල් සීමාව තුළ සිදුකළ නොහැකි අතර ඒ සඳහා ඇස්තමේන්තු කිරීමක්ද සිදුකර නොමැති බවත් මේ වන විට වැසිකිළිය ප්‍රයෝජනයට ගන්නා බවත් දන්වා ඇත. |
| (ආ) | ගම්පෙරළිය වේගවත් සංවර්ධන වැඩසටහන යටතේ දොළුව ඉල්ලගොල්ල කණිෂ්ඨ විදුහලේ සිසුන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පද්ධතියක් පාසල් සංවර්ධන සමිතිය මඟින් රු.485,000 ක වියදමක් දරා ඉදිකර තිබුණි. වැසිකිළි පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් නිම කර මාස 05 ක් ගතව තිබුණද ඉදිකර ඇති වැසිකිළිය සඳහා දළඹ සකස් කිරීම හා දොරවල් හා බිත්ති සඳහා තීන්ත ආලේප කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | ඇස්තමේන්තු හා නියමිත පිරිවිතරයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුවීම. | අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවන බැවින් විමසුමේ සඳහන් කාර්යයන් ඉටුනොකළ අතර ඉටු කළ නොහැකි වැඩ කොටස් පාසල මඟින් ඉටුකරගන්නා බව හා වැසිකිළිය මේ වන විට භාවිතයට ගන්නා බව දන්වා ඇත. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "නිල පියස" රජයේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ආදාහන මළුව පාර අස්ගිරියේ පිහිටි රජයේ නිවාස සම්පූර්ණයෙන් ඉවත් කර මහල් 4 කින් යුත් නිවාස 8 ක් ඉදි කිරීමට 2017 දෙසැම්බර් 06 වන දින රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය හා කොන්ත්‍රාත්කරු අතර රු.87,900,000 ක ඇස්තමේන්තු වටිනාකමට ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2018 සැප්තැම්බර් 13 දින වනවිට කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ගිවිසගෙන තිබුණද, භූමියේ අයිතිය නිරවුල් කර ඉදිකිරීම් කටයුතු සඳහා භාරදීම ප්‍රමාද වීම, ව්‍යුහාත්මක සැලැසුම් විටින් විට වෙනස් කිරීම, ඇස්තමේන්තුව තුළ අයිතම ප්‍රමාණවත් පරිදි ඇතුළත් කර නොතිබීම වැනි හේතූන් ඉදිරිපත් කරමින් 2019 දෙසැම්බර් 31 දින දක්වා තෙවරක් දින දිගු ලබාගෙන තිබූ නමුත් 2020 පෙබරවාරි 12 දින දක්වාත් වැඩ අවසන් කර නොතිබුණි. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටුවන පරිදි ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘති ඉටු කර ගත යුතුවීම. | නිවාස සංකීර්ණය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය යන සියලු කාර්යයන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් මෙහෙයවනු ලබන බැවින් ප්‍රමාද වීම පිළිබඳව විමසීම් අමාත්‍යාංශයෙන් සිදු කරන ලෙස දන්වා ඇත. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම තුළ තම ඉලක්කගත වැඩසටහන් දක්වා තිබූ ගිණුම් අංශයෙහි 2019 වර්ෂය තුළදී අත්කරගන්නා ලද ප්‍රගතිය කාර්යසාධන වාර්තා තුළ දක්වා නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තුළ ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරකම්වලට අදාළව කාර්යයසාධනයන් කාර්යයසාධන වාර්තාව තුළ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. | අතපසුවීමකින් කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නැත. අවසන් කාර්යසාධන වාර්තාවේ තොරතුරු ඇතුළත් කර ඇති බව දන්වා ඇත. |
| (ආ) ආපදා කළමනාකරණ, ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා , කෘෂිකර්ම හා ක්‍රම සම්පාදන යන අංශයන් යටතේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වැඩසටහන් 15 ක ප්‍රගතීන් | ක්‍රියාකාරි සැලැස්ම තුළ ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරකම්වලට අදාළව කාර්යයසාධනයන් කාර්යයසාධන වාර්තාව තුළ ඇතුළත් කිරීමට කටයුතු කළ | ආපදා කළමනාකරණ අංශයේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | කාර්යසාධන වාර්තාව තුළ දක්වා නොතිබුණි. | යුතු වීම. | ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අංශයේ ක්‍රියාකාරකම් 18 ක ප්‍රගතිය නිවැරදිව කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර ඇත.<br><br>කෘෂිකර්ම අංශයේ වැඩසටහන් සම්පිණ්ඩනයක් ලෙස කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර ඇත.<br><br>ක්‍රමසම්පාදන අංශයේ ක්‍රියාකාරී සැලැසුමට ඇතුළත් වැඩසටහන්වල ප්‍රගතිය අතපසුවීමකින් කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීම මඟහැරී ඇත. එම ප්‍රගතිය ඇතුළත් කර කාර්යසාධන වාර්තාව සකස් කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | ක්‍රමසම්පාදන අංශය යටතේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ වැඩසටහන් තුනකට අදාළ වාර්ෂික ඉලක්කයන් සංශෝධනය කිරීමකින් තොරව කාර්යසාධන වාර්තාවේ වාර්ෂික ඉලක්කයන් වෙනස්ව දැක්වීම හේතුවෙන් ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළව ළඟාකරගත් ප්‍රගතියේ මට්ටම සත්‍ය ඉලක්කයට අනුව ළඟාකරගත් ප්‍රගතියත් සමඟ සසඳා බැලීමේදී විශාල වශයෙන් වැඩි පරාසයක පැවතුණි. | සැලැසුම් කළ ව්‍යාපෘති සඳහා ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයන් සැලසෙන ආකාරයෙන් අනුමත ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | වාර්ෂික ඉලක්කය ක්‍රියාකාරී සැලැස්මට අනුව එසේ වුවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සියළු යෝජිත ව්‍යාපෘති අනුමත නොවීම ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක පාරිසරික ගැටළු ඇතිවීම මැතිවරණ කාල සීමාව තුළ නව ව්‍යාපෘති ආරම්භ කිරීම අත්හිටුවීම, වැනි ගැටළු හේතුවෙන් මෙය වෙනස් වූ අතර ඒ සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර යුතුව තිබුණද ඊට සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මක් ඉදිරිපත් කිරීම අතපසුවීම මත ප්‍රගතිය ඌනයක් ලෙස පෙන්නුම් කරන බව දන්වා ඇත. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) මාර්ගෝපදේශය පරිදි ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එසේ පිළියෙල කර නොතිබීම හේතුවෙන් ප්‍රසම්පාදන ඉලක්ක කවරේද යන්න පැහැදිලිව හඳුනාගත නොහැකි විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුවීම. | 2001,2002,2003,2102,2103 හා 2401 යන වැය විෂයයන්වලට වෙන් වී ඇති මුදල රු.මි.21.3 ක් වූ අතර එම මුදල කාර්යාල 21 සඳහා කෙසේ බෙදා හරින්නේද යන ගැටළුව නිසා විස්තරාත්මක සැලැස්ම පිළියෙල කිරීම වෙනුවට වැය විෂයයන් සඳහා පමණක් පිළියෙල කළ බව පෙන්වා දෙමි. 2104 වැය විෂයය යටතේ විස්තරාත්මකව ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 ජුනි 30 දින සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, එක් එක් වැය විෂයය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ප්‍රතිපාදන වෙන්වන ආකාරය වෙන් වෙන්ව දැක්වෙන පරිදි විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොතිබීමෙන් ප්‍රසම්පාදන සැලැස්මකින් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. | වැය විෂයයන් 6 ක් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය රු.මිලියන 21.3 කි. එම ප්‍රතිපාදනය කාර්යාල 21 ක් තුළ වැඩ විෂයයන් අතර බෙදා හැරීම ගැටළුකාරී වූ බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වෙන්කර දිය හැකි ප්‍රතිපාදනයන් නිශ්චිතවම දැක්වීම අසීරු විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාලීන අවශ්‍යතාවය සලකා බලා ප්‍රතිපාදන වෙන්කර දීමේ ක්‍රමවේදයක් දැනට අනුගමනය කළ බව දන්වා ඇත. |
| (ඇ) | එක් එක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනයන් නිශ්චිතවම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලැසුම් කර තිබිය යුතු වුවද, ප්‍රසම්පාදන සැලැස්මේ එය නිවැරදිව හඳුනාගෙන නොතිබූ අතර, ඒ වෙනුවට "වර්ෂය තුළ" වශයෙන් | එක් එක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනයන් නිශ්චිතවම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලැසුම් කළ යුතුවීම. | 2104 වැය විෂයය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙළ කර තිබූ අතර අනෙක් මූලධන වැය විෂයයන් සඳහා විස්තරාත්මක සැලැස්මක් |

| | | | |
|---|---|---|---|
| | සඳහන් කිරීම පමණක් සිදුකර තිබුණි. | | පිළියෙළ කර නොතිබූ නිසා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබූ බව දන්වා ඇත. |
| (ඈ) | ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ හෝ සංශෝධිත සැලැස්මේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් 2019 වර්ෂය තුළ මූලධන වැය විෂයයන් 4 ක් යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක ඉටු කිරීමට බලාපොරොත්තු වූ රු.6,315,851 ක වැඩ විෂයයන් පිළිබඳ තොරතුරු අන්තර්ගත වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට බලාපොරොත්තු වන මූලධන වැය විෂයයන්ට අදාළ සියළුම ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතුවීම. | 2001,2002,2003 යන වැය විෂයයන් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් නොව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වූ බැවින් ප්‍රතිපාදන සැලැස්මට ඇතුළත් නොකරන ලද අතර 2020 වර්ෂයේදී ඇතුළත් කිරීමට පියවර ගත් බව දන්වා ඇත. |

**3.6 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------------- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 05 ක් මාස 6 ත් වර්ෂ 7 ත් අතර කාලයක් අබලන් වීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව පැවතුණි. රජයේ නිවාස ලබාගැනීම සඳහා නිලධාරීන් 72 ක් වර්ෂ 06 ක සිට පොරොත්තු ලේඛනයේ සිටියද උක්ත නිවාස අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර නිලධාරීන්ට ලබාදීම කෙරෙහි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අවධානය යොමු කර නොතිබුණි | කොටස් වශයෙන් හෝ අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන වෙන්කර නිවාස අලුත්වැඩියා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | අළුත්වැඩියාවක් සඳහා ඇස්තමේන්තු සකස් කළද ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සිදු කර නොමැති බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016, 2018 හා 2019 වර්ෂවල පිළිවෙලින් රු.2,514,446 ක්, රු.228,433 ක් හා රු.463,673 ක රජයේ නිවාස අලුත්වැඩියා සඳහා වියදම් දරා තිබුණ ද මේ වනවිට අතහැරදමා ඇති නිවාස 05 වෙනුවෙන් කිසිදු අලුත්වැඩියාවක් සිදු කර නොතිබුණි. | රජයේ නිවාස අළුත්වැඩියා කර අබලන් වීමට ඉඩනොදී ප්‍රයෝජනයට ගතහැකි මට්ටමට පත්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අබලන් නිවාස 5 හි ඇස්තමේන්තු ඉහළ වටිනාකමක් වූ බැවින් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව දන්වා ඇත. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1999 අප්‍රේල් 09 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන චක්‍රලේඛ අංක 1/99 හා 2008 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක HA/GN/4/2/1/පොදු ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රියදුරු මහතෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඇප ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතුවීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රියදුරු මහතාගේ පෞද්ගලික ලිපිගොනුව මේ වන තෙක් ලැබී නොමැති බැවින් ඇප මුදල් තැන්පත් කිරීම සිදු කර නොමැති බව දන්වා ඇත. |

## 3.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රථ වාහන හානි ලේඛනය අනුව රු.3,418,095 ක් වටිනා වාහන අනතුරු දෙකක් 2019 මූල්‍ය ප්‍රකාශනයේ "පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය - සටහන (i)"හි ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | එම වාහන අනතුරු 02 පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කරන ලදි. |
| (ආ) | අංක CPPC– 4579 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහනය 2019 ජුලි 21 දින අනතුරට පත්ව තිබුණද ඒ පිළිබඳ තොරතුරු වාහන අනතුරු ලේඛනයේ ඇතුළත් කර නොතිබූ අතර, එම අනතුරට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් නොවීමෙන් පාඩු හා හානි අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ද තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සියලු තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම. | CPPC - 4579 කැබ් රථය අනතුරට අදාළව මු.රෙ 104(4) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදු කරන බව දන්වා ඇත. |
| (ඇ) | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක CPPD – 6103 වාහනයේ 2017 මැයි 05 දිනැති අනතුරට අදාළව මුළු පිරිවැය රු.2,223,927 ක් වූ අතර, මේ වනවිට ආවරණය නොවූ රු. 210,093 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් | මුදල් රෙගුලාසි නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | CPPD-6103 වාහන අනතුර සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් නඩු පැවරීමට අදාළව කටයුතු සිදුකරනු ලබන අතර, බස් රථයේ රියදුරු මිය ගොස් ඇති බවත් ඒ පිළිබඳ තොරතුරු |

| | | | |
|---|---|---|---|
| | අයකර ගැනීම සම්බන්ධව අමාත්‍යාංශයේ 2019 අගෝස්තු 5 දිනැති අංක HA/F/19/WRI/04/P-6 දරන ප්‍රධාන ගණකාධිකාරිගේ ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | ලිපියක් මඟින් දන්වන බවත් ඒ අනුව ඉදිරි කටයුතු නීති පති දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දෙන බවත් තොරතුරු යාවත්කාලීනව වාර්තා කරන බවත් ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. |
| (ඇ) | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක WPPA-4984 දරන වාහනය 2008 නොවැම්බර් මස අනතුරට පත්වී තිබුණි. ඒ සඳහා වූ අලුත්වැඩියා වියදම රු.288,348 ක් වූ අතර කමිටු තීරණය ප්‍රකාරව ඉන් සියයට 50 ක මුදල වගකිව යුතු පාර්ශවයගෙන් අය කර ගැනීමට තීරණය කර තිබුණද 2020 අප්‍රේල් 30 දින වන විට එම මුදල් අය කර ගෙන නොතිබුණි. | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ලිපි ගොනුව අනුව 2020 මැයි 21 දිනැතිව රු.50,000 ක මුදලක් ගෙවා ඇති බවත්, ඉතිරි මුදල වාරික දෙකකින් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත. . |

## 3.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | උඩපළාත, පාතදුම්බර හා යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 03 දෙනෙකු යතුරු පැදි ලබාගැනීමෙන් පසු යතුරුපැදි හිමි නොවන වෙනත් තනතුරුවලට මාරුවී ගොස් තිබුණද 2017 අගෝස්තු 04 දිනැති අංක බීඩී/1/1/11/1/(උප)1/2017 දරන ලිපිය ප්‍රකාරව ඔවුන්ගෙන් යතුරු පැදියේ වෙළඳපොළ වටිනාකම වූ රු.421,920 ක මුදලක් ආපසු අයකරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව යතුරුපැදියේ වෙළඳපල වටිනාකම ආපසු අයකර ගත යුතු වීම. | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිනිය වෙත අදාළ අමාත්‍යාංශය හරහා අවස්ථා කිහිපයකදී දැනුම් දී ඇති අතර, නීතිමය පියවර ගැනීමට කටයුතු කරනබවත් යටිනුවර නිලධාරිනියගෙන් මුදල් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් පාතදුම්බර නිලධාරීයා හට යතුරු පැදියේ වටිනාකම ගෙවන ලෙසත් දන්වා ඇත. |
| (ආ) | 2019 නොවැම්බර් 22 දිනැති අංක BD/GPS/130/9/4/MC-8 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ ලිපියේ 2 ඡේදයෙන් එක් නිලධාරියෙකුට එක් යතුරු පැදියක් පමණක් හිමිවන බව දක්වා තිබුණද සහනදායී පදනමට යතුරුපැදි ලබාගත් ක්ෂේත්‍ර | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2019 අප්‍රේල් 29 දිනැති විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නීත්‍යානුකූලව යතුරුපැදිය ලබා දී ඇති බවත් දෙවන යතුරු පැදිය පළාත් පාලන ආයතන වලින් ලබාගෙන ඇති බැවින් ප්‍රධාන |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන් 6 දෙනෙකු හට පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින් සඳහා සහන පදනමට ලබාදුන් යතුරුපැදි ද ලබාගෙන තිබුණි (මධ්‍යම පළාත් පාලන කොමසාරිස් තහවුරු කර ඇති පරිදි).එහෙත් ඔවුන්ගෙන් එක් යතුරුපැදියක වෙළඳපල වටිනාකම අයකරගෙන නොතිබුණි. | | ලේකම් වෙත යොමු කිරීමටත් තීරණය වූ බව දන්වා ඇත. |

**3.10 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියැදි පරික්ෂාවේදී තුම්පනේ, මැදදුම්බර, දොළුව හා පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අවස්ථා 15 කදී ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන්, වර්ෂ 2 ත් වර්ෂ 23 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් පැවති අතර, ඒ හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අත්පත් කර ගැනීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම් අත් පත් කර ගැනීමේදී ආයතන ගණනාවක් සම්බන්ධ කර ගැනීමට සිදුවන බැවින් එම ක්‍රියාවලිය තුළ රාජකාරිමය ප්‍රමාදයන් සිදු වන බවත් හිමිකම් හා වන්දි පරීක්ෂණ වලදී කාලපමාවක් සිදු වන බවත් ප්‍රාදේශීය ලේකම්වරුන් දන්වා ඇත. |
| (ආ) | පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2013, 2014 හා 2017 යන වර්ෂවල අධි අවදානම් කලාපවල පදිංචි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වෙනත් ස්ථානයක පදිංචි කළ යුතු පවුල් 87 ක් හඳුනාගෙන තිබුණි. ඒ අතුරින් පවුල් 74 ක් වෙනත් ස්ථානයක පදිංචියට යාමට කැමැත්ත ප්‍රකාශ කර තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් මාසය වන විටත් ඉඩම අත්පත් කර ගැනීමේ පනතේ 07 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීම් ඉංග්‍රීසි /දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. | අධි අවදානම් කලාපවල පදිංචි , වෙනත් ස්ථානයක පදිංචිවීමට කැමැත්ත පළකළ පවුල් කඩිනමින් සුදුසු ස්ථානවල පදිංචි කිරීමට කටයුතු කළ යුතුවීම. | රජයේ ඉඩම්වල පදිංචිය සඳහා ඔවුන්ගේ අකමැත්ත ප්‍රකාශ කිරීම හේතුවෙන් ග්‍රාම නිලධාරීන් විසින් විකල්ප අවස්ථාවන් සඳහා කැමැත්ත පල කළ ආකාරය පිළිබඳ තොරතුරු රැස් කර දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර ඇති බව දන්වා ඇත.හිමිකම් පරීක්ෂණ පැවැත්වීම කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ප්‍රමාද වූ අතර ඒ සඳහා දින නියම කර දැන්වීම රජයේ මුද්‍රණාලය වෙත 2020 ජුනි 19 දින යොමු කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ඔක්තෝබර් 01 දිනැති අංක GSM/KRC/AGA/2018/36 දරන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ලේඛකාධිකාරීගේ ලිපිය ප්‍රකාරව සෑම මසකම අවසානයේ එලඹෙන ඊළඟ මස 10 වන දිනට අය විය යුතු පරිපාලන ගාස්තු රඳවාගෙන ඉතිරි මුදල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත යැවිය යුතු විය. එහෙත් නියැදි පරික්ෂාවේදී හතරලියද්ද හා පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල වැලි හා පස් බලපත්‍ර නිකුත් කිරීමේදී අයකරනු ලැබූ එකතුව රු.155,898 ක ආදායම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාලංශය වෙත ප්‍රේෂණය කිරිමේදී දින 09 ත් දින 23 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් පැවතිණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රමාදයන් පිළිගෙන ඇති අතර ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව අප්‍රමාදව යැවීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් දන්වා ඇත. |
| (ඈ) | තුම්පනේ හා පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාල දෙකෙහි රජයට අයත් පර්චස් 02 ත් පර්චස් 120 ත් අතර භූමි ප්‍රමාණයක වූ ඉඩම් කට්ටි 75 ක අනවසර පදිංචිය හෝ අනවසර පරිහරණය නිරීක්ෂණය විය. | නිලධාරීන් තම රාජකාරිය නිසිලෙස ඉටු කළ යුතු වීම. | දෙසති වාර්තා ග්‍රාම නිලධාරින් මඟින් ලබා ගනී. අනවසර පදිංචිකරුවන් පිළිබඳ ලේඛනයක් සකස් කර ඇත. ඒ අය සඳහා ඉඩම් නියමානුකූල කිරීමට පළාත් ඉඩම් කොමසාරිස් වෙත යැවීමට, ඉඩම් කච්චේරි පැවැත්වීමට සංවර්ධන වාර්තා සකස් කිරීමට ඉඩම් මැනීමට හා මැනුම් නියෝග යැවීමට කටයුතු කරමින් පවතින බව පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. 2019 දෙසැම්බර් 19 දින ඉඩම් කච්චේරියක් පවත්වා එම ඉඩම් නියමානුකූල කිරීමට කටයුතු කර ඇති බවත් රජයේ ඉඩම් නීති විරෝධි ලෙස අල්ලා ගැනීම පාලනය කිරීමට ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් මාසික වාර්තා කැඳවා ඇති බව තුම්පනේ ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇති බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2010 මැයි 22 දිනැති අංක PF 443 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මාසික ඉන්ධන අවශ්‍යතාවය අනුව සමුපකාර සමිතිය වෙත තැන්පත් මුදලක් තබා එම තැන්පත් මුදලේ ප්‍රමාණය නොඉක්මවීමේ පදනම මත සමිතිය සතු පිරවුම්හල්වලින් ඉන්ධන ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බවත් රාජ්‍ය ආයතන තම ඉන්ධන අවශ්‍යතා ලබා ගැනීමේදී සමූපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල්වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවටත් උපදෙස් දී තිබුණි. එහෙත් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉන්ධන ලබා දීමේදී යථෝක්ත ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නිලධාරීන් තම රාජකාරී කටයුතු කළ යුතු වීම. | පෙර ඉන්ධන ඇණවුම් ක්‍රමය අනුගමනය කළද විවිධ ගැටළු මත එයින් බැහැර වීමට සිදු විය. නැවතත් විවිධ සේවා සමූපකාර සමිති මගින් ඉන්ධන ලබා ගැනීමේ හැකියාව අධ්‍යනය කර, කළමනාකරණ තීරණයක් ගෙන, ක්‍රියාත්මක කිරීම සලකා බලන බව දන්වා ඇත. |
| (ඊ) | ගම්පෙරළිය වේගවත් සංවර්ධන වැඩ සටහන - මාර්ග ප්‍රතිසංස්කරණය යටතේ අදියර දෙකකදී මාර්ග 96 ක් සංවර්ධනය කිරීම සඳහා රු.51,588,445 ක් වැය කර තිබුණි. මෙම වැඩ සටහන යටතේ සංවර්ධනය කරන ලද මාර්ග සඳහා උඩපළාත ප්‍රාදේශීය සභාව එකඟතාවය ලබාදී තිබුණත් එමගින් සංවර්ධනය කර ඇති මාර්ග වැඩි ප්‍රමාණයක් ගැසට් කර නොතිබුණි. | නිලධාරීන් තම රාජකාරිය නිසි පරිදි ඉටු කිරීම. | මාර්ග සංවර්ධනය ප්‍රාදේශීය සභාවේ අනුමැතිය මත සිදු කිරීමෙන් පසු නැවත ප්‍රාදේශීය සභාව වෙත පැවරීම සිදු කරන ලදී. එම මාර්ග ගැසට් පත්‍රයේ පළ කිරීම ප්‍රාදේශීය සභාව විසින් සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (උ) | වී මිල දී ගැනීම සඳහා මිනිපේ සමූපකාර සමිතිය වෙත 2000 වර්ෂයේ ලබා දී තිබූ රු.4,303,617 ක අත්තිකාරම් මුදලින් 2020 ජුනි 30 දින වන විට රු.1,231,687 ක මුදලක් අයවීමට පැවැතුණි. | 2012 මාර්තු 22 හා 2016 පෙබරවාරි 23 දිනවල පැවැති රාජ්‍ය ගිණුම් කාරක සභා තිරණ අනුව මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දි ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන බව දන්වා ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආගමික කටයුතු අංශය යටතේ දක්වා තිබූ තිරසර සංවර්ධන අරමුණ හා ළඟා කර ගැනීමට අපේක්ෂිත | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් නිවැරදිව පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ආගමික කටයුතු අංශය යටතේ දක්වා ඇති තිරසර සංවර්ධන අරමුණු හා ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් ලෙස |

| | |
|---|---|
| ඉලක්කයන් එම අංශය යටතේ දක්වා තිබූ ක්‍රියාකාරකම් හා නොගැලපුන අතර, ඉටු කිරීමට සැලැසුම් කර තිබූ ක්‍රියාකාරකම් තුළින් තිරසර අරමුණු හා ඉලක්කයන් ළඟාකර ගැනිමේ හැකියාවක් නොපැවතුණි. | ප්‍රමාද දෝෂයකින් අදාළ නොවන ඉලක්කයන් ඇතුළත් වුවද එය මේ වන විට නිවැරදි කර ඇති බව දන්වා ඇත. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) වගන්තිය අනුව යම් ඉල්ලීමක් ලද විගස අදාළ නිලධාරියා විසින් වහාම එම ඉල්ලීම ලැබීම් පිළිබඳ ලිඛිත දැනුම්දීමක් කළයුතු වුවද මැදදුම්බර, පාතහේවාහැට හා දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉල්ලීම ලද බව දන්වා යැවීමේදී අවස්ථා 15 කදී දින 02 සිට දින 15 දක්වා කාල පමාවක් සිදුව තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා උචිත පියවරයන් ගැනීමට කටයුතු කරන ලබන බව දන්වා ඇත. |
| (ආ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 25(1) වගන්තිය අනුව ඉල්ලීමක් ලැබී වැඩකරන දින 14 ක් ඇතුළත ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 05 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළයුතුය. එම තීරණය ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතු බව දන්වා තිබුණද මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එම සීමාව ඉක්මවා දින 4 සිට දින 49 දක්වා ප්‍රමාද කර තොරතුරු සැපයූ අවස්ථා 04 ක් විය. | නොපමාව කටයුතු අවසන් කළ යුතුවීම. | මුදල් ගෙවීමේ කටයුතු සම්පූර්ණ කිරීමට කාලයක් ගත වන බව හා තොරතුරු ලබා ගැනීමට පැමිණීමේ කාල ප්‍රමාදයක් සිදු වන බව වාර්තා කර ඇති බව දන්වා ඇත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 305 ක් පැවතිය ද 2020 මාර්තු 31 දිනටද මෙම පුරප්පාඩු සංඛ්‍යාව නොවෙනස්ව පැවතුණි. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 පළමු කාර්තුවට අදාළ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හි කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම සිදු නොවුන බව දන්වා ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට නියෝජ්‍ය සැලැසුම් අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි, භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරි, තාක්ෂණ නිලධාරි, කළමනාකරණ සහකාර, තොරතුරු තාක්ෂණ නිලධාරි යන තනතුරු සඳහා සැලකිය යුතු ප්‍රමාණයක පුරප්පාඩු පැවති අතර, එම පුරප්පාඩු දිගු කාලීනව පැවතීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ඉටුවිය යුතු මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීමට බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම නිලධාරීන් විශ්‍රාම යෑම මියයෑම හා ස්ථාන මාරු වී යෑම හේතුවෙන් තනතුරු පුරප්පාඩු වී ඇති අතර, ඒ පිළිබඳ වාර්තා තෙයි මාසිකව කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පුරප්පාඩු පිරවීම සිදුකරන බව දන්වා ඇත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දින වන විට මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 ක් තුළ ග්‍රාම නිලධාරී වසම් 1187 ක ග්‍රාම නිලධාරී පුරප්පාඩු 123 ක් පැවතුණි. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි ස්ථානමාරු ප්‍රතිපත්තිය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබීම හේතුවෙන් නිලධාරීන් 325 දෙනෙකු එකම සේවා ස්ථානයක බොහෝ කාලයක් රැඳී තිබුණි. | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 1) හි xviii පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන හා 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සිදු කළ යුතු වීම. | ඇතැම් නිලධාරීන් විසින් ස්ථාන මාරු විම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේ ඉල්ලීම් කර ඇති නමුත් ස්ථාන මාරු වීම් ලබා දී නොමැත. ස්ථාන මාරු වීම් ඉල්ලා නොමැති නිලධාරීන්ගේ සේවා කාලය සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වෙත යවා ඇති බව දන්වා ඇත. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 15 ක පරිවාස කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නිලධාරින් 60 දෙනෙකුගේ පරිවාස කාලය ඉක්මවා 2019 දෙසැම්බර් 31 දිනට වසර 3 ක් සේවය කර තිබුණද ඔවුන් සේවයේ ස්ථිර කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 17 ක පරිවාස කාලයෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් තවත් නිලධාරින් 169 දෙනෙකු 2019 දෙසැම්බර් 31 දිනට කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී වසර 1 යි මාස 6 ත් වසර 3ත් අතර කාලයක් සේවය කර තිබුණද ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නිලධාරින්ගේ සේවය කඩිනමින් ස්ථිර කිරීමට කටයුතු කළ යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හී ඇතැම් සංවර්ධන නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සේවය ස්ථිර කිරීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇති අතර, ඇතැම් නිලධාරීන්ගේ ලිපිගොනු වල අඩුපාඩු පවතින බැවින් ඒවා සකස් කරමින් පවතින බව දන්වා ඇත. |